## අනුමානයක් සිදු කරන පියවර




## වායු සාම්පල රැස්කිරීමට විද්‍යාගාරයේ භාවිතා කරන ඇටවුම



| පදනම් SI ඒකක | | |
|---|---|---|
| භෞතික රාශිය හා සංකේතය | ඒකකයේ නම | ඒකකයේ සංකේතය |
| දිග (l) | *meter* | m |
| ස්කන්ධය (m) | *kilogram* | kg |
| කාලය (t) | *second* | s |
| විද්‍යුත් ධාරාව (I) | *ampere* | A |
| තාපගතික උෂ්ණත්වය (T) | *kelvin* | K |
| ද්‍රව්‍ය ප්‍රමාණය (n) | *mols* | mol |
| දීප්ත තීව්‍රතාවය ($I_v$) | *candela* | cd |
| අනුපූරක SI ඒකක | | |
| තල කෝණය | *radian* | rad |
| ඝන කෝණය | *steradian* | sr |

| ව්‍යුත්පන්න SI ඒකක | |
|---|---|
| භෞතික රාශිය හා සංකේතය | ඒකකයේ සංකේතය |
| වර්ගඵලය (A) | $m^2$ |
| පරිමාව (V) | $m^3$ |
| ඝණත්වය (d/ρ) | $kg\ m^{-3}$ |
| ප්‍රවේගය (v) | $m\ s^{-1}$ |
| සාන්ද්‍රනය (c) | $mol\ m^{-3}$ |
| ගම්‍යතාවය (p) | $kg\ m\ s^{-1}$ |
| මවුලික ස්කන්ධය (M) | $kg\ mol^{-1}$ |
| මවුලික පරිමාව ($V_m$) | $m^3\ mol^{-1}$ |

| විශේෂ නම් සහිත ව්‍යුත්පන්න SI ඒකක | | | |
|---|---|---|---|
| භෞතික රාශිය හා සංකේතය | ඒකකයේ නම | ඒකකයේ සංකේතය | ව්‍යුත්පන්න SI ඒකකය |
| බලය | නිව්ටන් | N | $1\ N = 1kg\ m\ s^{-1}$ |
| පීඩනය | පැස්කල් | Pa | $1\ Pa = 1\ N\ m^{-2}$ |
| ශක්තිය | ජූල් | J | $1\ J = 1kg\ m^2\ s^{-1}$ |
| විද්‍යුත් ප්‍රමාණය | කූලෝම් | C | $1\ C = 1\ A\ s$ |
| විද්‍යුත් ධාරිතාව | ෆැරඩ් | F | $1\ F = 96490\ C$ |
| සංඛ්‍යාතය | හර්ට්ස් | Hz | $1\ Hz = 1\ s^{-1}$ |
| සෙල්සියස් උෂ්ණත්වය | සෙල්සියස් | $^0C$ | $1\ ^0C = 1\ K$ |

| ගුණාකාරයෝ | | |
|---|---|---|
| $10^1$ | *deca* | da |
| $10^2$ | *hecta* | h |
| $10^3$ | *kilo* | k |
| $10^6$ | *mega* | M |
| $10^9$ | *giga* | G |
| $10^{12}$ | *tera* | T |
| $10^{15}$ | *peta* | P |

| | | |
|---|---|---|
| $10^{-1}$ | *deci* | d |
| $10^{-2}$ | *centi* | c |
| $10^{-3}$ | *milli* | m |
| $10^{-6}$ | *micro* | μ |
| $10^{-9}$ | *nano* | n |

| | | |
|---|---|---|
| $10^{-12}$ | *pico* | p |
| $10^{-15}$ | *femto* | f |

සංයෝග හා අයන $IUPAC$ නාමකරණය

විචල්‍ය ඔක්සිකරණ අංක නොමැති ලෝහ අයන නාමකරනයේදි ලෝහයේ නාමයම අයනයටද යොදයි.

| සංකේතය | නම | සංකේතය | නම |
|---|---|---|---|
| $H^+$ | Hydrogen ion | $Cs^+$ | Cisium ion |
| $Na^+$ | Sodium ion | $Ag^+$ | Silver ion |
| $Li^+$ | Lithium ion | $NH_4^+$ | Ammonium ion |
| $K^+$ | Potassium ion | | |

විචල්‍ය ඔක්සිකරණ අංක ඇති ලෝහ අයන නාමකරනයේදි අඩු ඔක්සිකරණ අංකය සහිත අයනයට “us” ප්‍රත්‍ය ද, වැඩි ඔක්සිකරණ අංකය සහිත අයනයට “ic” ප්‍රත්‍ය ද යොදයි.

| සංකේතය | නම | සංකේතය | නම |
|---|---|---|---|
| $Cu^+$ | Cupper (I) /Cuprus ion | $Pb^{2+}$ | Lead(II) /Plumbous ion |
| $Cu^{2+}$ | Cupper (II) /Cupric ion | $Pb^{4+}$ | Lead(IV) /Plumbic ion |
| $Fe^{2+}$ | Iron (II) /Ferrous ion | $Sn^{2+}$ | Tin(II) / Stanous ion |
| $Fe^{3+}$ | Iron (III) /Ferric ion | $Sn^{4+}$ | Tin(IV) /Stanic ion |
| $Hg_2^{2+}$ | Mercury(I) /Mercurous ion | | |
| $Hg^{2+}$ | Mercury(II) /Mercuric ion | | |

සරල ඇනායන ප්‍රත්‍යයෙන් “ide” ද, විචල්‍ය ඔක්සිකරණ අංක ඇති ඇනායන නාමකරනයේදි අඩු ඔක්සිකරණ අංකය සහිත අයනයට “ite” ප්‍රත්‍ය ද, වැඩි ඔක්සිකරණ අංකය සහිත අයනයට “ate” ප්‍රත්‍ය ද යොදයි.

| සංකේතය | නම | සංකේතය | නම |
|---|---|---|---|
| $F^-$ | Fluoride ion | $P^{3-}$ | Phosphide ion |
| $Cl^-$ | Chloride ion | $OH^-$ | Hydroxide ion |
| $Br^-$ | Bromide ion | $CN^-$ | Cynide ion |
| $I^-$ | Iodide ion | | |
| $O^{2-}$ | Oxide ion | $N^{3-}$ | Nitride ion |
| $O_2^{2-}$ | Peroxide ion | ${NO_2}^-$ | Nitrate(III)/ Nitrite ion |
| $O_2^-$ | Superoxide ion | ${NO_3}^-$ | Nitrate(V)/ Nitrate ion |
| $S^{2-}$ | Sulphide ion | ${CO_3}^{2-}$ | Carbonate(VI) / Carbonate ion |
| $HS^-$ | Bisulphide ion | ${HCO_3}^-$ | bicarbonate / hidrogen carbonate ion |
| ${SO_3}^{2-}$ | Sulphate(IV)/Sulphite ion | | |
| ${HSO_3}^-$ | bisulphite/hydrogen sulphite ion | ${MnO_4}^-$ | Manganate(VII) /permanganate ion |
| ${SO_4}^{2-}$ | Sulphate(VI)/Sulphate ion | ${MnO_4}^{2-}$ | Manganate(VI) /Manganate ion |
| ${HSO_4}^-$ | bisulphate/hydrogen sulphate ion | | |

පහත සංයෝග වල $IUPAC$ නාමය ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| **i.** | $(NH_4)_2Cr_2O_7$ | **ix.** | $H_2SO_3$ | **xvii.** | $FeBr_3$ |
| **ii.** | $Na_2CrO_4$ | **x.** | $Fe_2C_2O_4$ | **xviii.** | $SnS_2$ |
| **iii.** | $CuSO_4$ | **xi.** | $Na_2S_2O_3$ | **xix.** | $SnS$ |
| **iv.** | $Cu_2SO_3$ | **xii.** | $HNO_3$ | **xx.** | $CO$ |
| **v.** | $Na_2CO_3$ | **xiii.** | $HNO_2$ | **xxi.** | $CO_2$ |
| **vi.** | $RbHCO_3$ | **xiv.** | $NaNO_3$ | **xxii.** | $SO_2$ |
| **vii.** | $(Li)_3PO_4$ | **xv.** | $KMnO_4$ | **xxiii.** | $SO_3$ |
| **viii.** | $H_2SO_4$ | **xvi.** | $K_2MnO_4$ | **xxiv.** | $N_2O$ |

**xxv.** $NO$

**xxvi.** $N_2O_3$

**xxvii.** $NO_2$

**xxviii.** $N_2O_5$

**xxix.** $CuS$

**xxx.** $CuHS$

**xxxi.** $K_2O$

**xxxii.** $K_2O_2$

**xxxiii.** $KO_2$

**xxxiv.** $H_2O_2$

**xxxv.** $MgS$

**xxxvi.** $Mg_2N_3$

**xxxvii.** $NaBiO_3$

**xxxviii.** $Na_3AsO_3$

**xxxix.** $Na_3AsO_4$

**xl.** $NH_4Fe(SO_4)_2$

| Charge | Formula | Name |
|---|---|---|
| +1 | $NH_4^+$ | ammonium |
| +2 | $Hg_2^{2+}$ | mercury (I) |
| | $BrO_3^-$ | bromate |
| | $C_2H_3O_2^-$ | acetate |
| | $ClO^-$ | hypochlorite |
| | $ClO_2^-$ | chlorite |
| | $ClO_3^-$ | chlorate |
| | $ClO_4^-$ | perchlorate |
| | $CN^-$ | cyanide |
| −1 | $HCO_3^-$ | hydrogen carbonate (common name is bicarbonate) |
| | $HSO_4^-$ | hydrogen sulfate (common name is bisulfate) |
| | $H_2PO_4^-$ | dihydrogen phosphate |
| | $MnO_4^-$ | permanganate |
| | $NO_2^-$ | nitrite |
| | $NO_3^-$ | nitrate |
| | $OH^-$ | hydroxide |
| | $SCN^-$ | thiocyanate |
| | $HPO_4$ | hydrogen phosphate |
| | $SO_3^{2-}$ | sulfite |
| | $SO_4^{2-}$ | sulfate |
| | $AsO_4^{3-}$ | arsenate |
| −3 | $PO_4^{3-}$ | phosphate |
| | $PO_3^{3-}$ | phosphite |

**සාපේක්ෂ පරමාණුක ස්කන්ධ හා සාපේක්ෂ අණුක ස්කන්ධ ආශ්‍රිත ගණනයන්**

1. $^{12}_{6}C$ සමස්ථානිකයේ පරමාණු $6.022 \times 10^{23}$ ක ස්කන්ධය $12.00\ g$ නම්, පරමාණුක ස්කන්ධය ඒකකයේ $(a.m.u)$ අගය සොයන්න..

2. $Ca$ පරමණුවක ස්කන්ධය $6.64 \times 10^{-23}\ g$ වේ නම්, $Ca$ හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය(සා.ප.ස්) සොයන්න.

3. $X$ පරමාණුවක ස්කන්ධය $13.22 \times 10^{-26}\ kg$ වේ. $X$ හි සා. ප. ස්. සොයන්න.

4. $Pb$ හි සා.ප.ස් 207 නම්, $Pb$ පරමාණුවක ස්කන්ධය සොයන්න.

5. $A$ පරමාණුවක ස්කන්ධය $^{12}_{6}C$ සමස්ථානිකයේ ස්කන්ධය මෙන් 8 ගුණයක් වේ නම් $A$ හි සා. ප. ස්. සොයන්න.

6. $Mg$ පරමාණුවක ස්කන්ධය $4.037 \times 10^{-23} g$ වන අතර $^{12}_{6}C$ පරමාණුවක ස්කන්ධය $1.993 \times 10^{-23}\ g$ වේ නම්, $Mg$ හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය (සා.ප.ස්) සොයන්න.

7. $Mg$ හි සමස්ථානික වල තොරතුරු පහත දැක්වේ. එමගින් $Mg$ හි සා.ප.ස් මධ්‍යක අගය සොයන්න.

| සමස්ථානික | සා.ප.ස් | සාපේක්ෂ සුලබතාවය % |
|---|---|---|
| $^{24}_{12}Mg$ | 24 | 78 |
| $^{25}_{12}Mg$ | 25 | 12 |
| $^{26}_{12}Mg$ | 26 | 10 |

8. ස්වාභාවික පවතින ක්ලෝරීන් $^{35}_{17}Cl, ^{37}_{17}Cl$ යන සමස්ථානික දෙකකින් යුක්ත වේ. ඒවායේ සාපේක්ෂ පරමාණුක ස්කන්ධ හා සාපේක්ෂ සුලබතාවය පිළිවෙලින් 35.0, 37.0 හා 75.8%, 24.2% නම් $Cl$ හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය(සා.ප.ස්) සොයන්න.

**මවුලය, මවුලික ස්කන්ධය හා ඇවගාඩ්‍රෝ නියතය ආශ්‍රිත ගණනයන්**

9. පහත සංයෝගවල මවුලික ස්කන්ධය සොයන්න.

| | | | | |
|---|---|---|---|---|
| $NaOH$ | $KCl$ | $MgO$ | $Ca(OH)_2$ | $(NH_4)_2CO_3$ |
| $CuSO_4$ | $CuSO_4.5H_2O$ | $(NH_4)_2Cr_2O_7$ | $Mg(HCO_3)_2$ | $C_{12}H_{22}O_{11}$ |
| $C_2H_5OH$ | $K_4Fe(CN)_6$ | $FeO$ | $Al(OH)_3$ | $NH_4Fe(SO_4)_2.12H_2O$ |
| $CuSO_3$ | $Na_2CO_3.10H_2O$ | $(NH_4)_3PO_4$ | $Al_2(CO_3)_3$ | $C_6H_{12}O_6$ |

10. පහත සංඝටක වල ස්කන්ධය සොයන්න.

i. $Mg^{2+}, 3\ mol$ ක
ii. $O$ පරමාණු $0.25\ mol$ ක
iii. $O_2$ අණු $0.5\ mol$ ක
iv. $S$ පරමාණු $0.75\ mol$ ක
v. $S_8$ අණු $0.75\ mol$ ක
vi. $CO_2, 2\ mol$ ක
vii. $H_2SO_4,\ 10\ mol$ ක
viii. $NaCl, 3\ mol$ ක
ix. $Ca(OH)_2, 0.75\ mol$ ක
x. $C_{12}H_{22}O_{11}, 0.5\ mol$ ක

$(\mathbf{Mg-24}, \quad \mathbf{O-16}, \quad \mathbf{S-2}, \quad \mathbf{Na-23}, \quad \mathbf{Ca-40}, \quad \mathbf{H-1}, \quad \mathbf{Cl-35.5})$

11. පහත සංඝටක වල මවුල ගණන සොයන්න.

i. $Pb, 69\ g$ ක
ii. $Fe, 14\ g$ ක
iii. $N_2,\ 56\ g$ ක
iv. $Hg,\ 16\ g$ ක
v. $Al,\ 0.9\ g$ ක
vi. $CaC_2O_4, 25.6\ g$ ක
vii. $Na_2CO_3,\ 5.3\ g$ ක
viii. $CaCO_3,\ 0.25\ g$ ක
ix. $C_{12}H_{22}O_{11},\ 9\ g$ ක
x. $Na_2CO_3.10H_2O,\ 5.72\ g$ ක

$(\mathbf{Pb-207}, \quad \mathbf{Fe-56}, \quad \mathbf{N-14}, \quad \mathbf{Hg-160}, \quad \mathbf{Al-27})$

12. පහත මූලද්‍රව්‍ය ස්කන්ධ වල පරමාණු සංඛ්‍යාව සොයන්න.

i. $Ca,\ 3.011 \times 10^{-3}\ g$ ක
ii. $Ar,\ 12.044 \times 10^{-3}\ g$ ක

iii. $Hg, 12\ g$ ක

**13.** $O_3$ (ඕසෝන්), ඔක්සිජන් හි එක් බහුරූපී ආකාරයක් වේ. ඕසෝන් $24\ g$ ක් තුල අන්තර්ගත වන,

a. $O_3$ අණු ගණන,
b. සංයොජිත $O$ පරමාණු ගණන,
c. සාම්පලයේ මුලු ඉලෙක්ට්‍රෝන ගණන සොයන්න. ($\boldsymbol{O = 16}$)

**14.** සුදු පොස්පරස් ස්වාභාවිකව $P_4$ අණු ලෙස පවති. $P_4$ , $124\ g$ ක් සපයා ඇත. ($\boldsymbol{P - 31}$)

a. $P_4$ මවුල ප්‍රමාණය,
b. $P_4$ අණු ගණන,
c. $P - P$ බන්ධන ගණන,
d. සාම්පලයේ සංයෝජිත $P$ පරමාණු ගණන,
e. සාම්පලයේ මුළු ඉලෙක්ට්‍රෝන ගණන,
ගණනය කරන්න.




**15.** $Propane(C_3H_8)$, $22.4\ g$ ක් තුල අන්තර්ගත වන

a. $C_3H_8$ මවුල ප්‍රමාණය,
b. $C_3H_8$ අණු ගණන,
c. සංයෝජිත මුළු පරමාණු ගණන,
d. $C - H$ මුළු බන්ධන ගණන,
ගණනය කරන්න. ($\boldsymbol{C = 12}$, $\boldsymbol{H = 1}$)

```
    H   H   H
    |   |   |
H - C - C - C - H
    |   |   |
    H   H   H
```

**16.** $(NH_4)_2\ Cr_2O_7$ සාම්පලයකින් $5.04\ g$ ප්‍රමාණයක් ඔබට සපයා ඇත.

a. $NH_4^+$ හා $Cr_2\ O_7^{2-}$ මවුල ප්‍රමාණය සොයන්න.
b. ඉහත $(NH_4)_2\ Cr_2O_7$ ප්‍රමාණය සම්පූර්ණයෙන්ම තාප වියෝජනය කලේ නම් ඉතිරි වන ඝණයේ ස්කන්ධය සොයන්න. ($\boldsymbol{N = 14}$, $\boldsymbol{O = 16}$, $\boldsymbol{Cr = 52}$, $\boldsymbol{H = 1}$)

$$(NH_4)_2\ Cr_2O_{7(s)} ----\rightarrow N_{2(g)} + Cr_2O_{3(s)} + 4\ H_2O_{(l)}$$

**17.** රොම්බසීය සල්පර් $S_8$ ලෙස පවතී. සල්පර් $3.2\ g$ ප්‍රමාණයක් ලබා දී ඇත.

a. $S_8$ අණු ගණන සොයන්න.
b. ඉහත සල්පර් සියල්ලම $SO_2$ බවට පත්කිරීමට අවශ්‍ය $O_2$ ස්කන්ධය සොයන්න. ($\boldsymbol{S = 32}$, $\boldsymbol{O = 16}$)

$$S_{(S)} + O_{2(g)} ---\rightarrow SO_2$$

## <u>සංයුතිය</u>

### ස්කන්ධ භාගය, පරිමා භාගය හා මවුල භාගය ආශ්‍රිත ගණනයන්

**18.** පහත සංයෝග වල පවතින එක් එක් මූලද්‍රව්‍යයේ ස්කන්ධය අනුව ප්‍රතිශතය දක්වන්න.
($\boldsymbol{N = 14}$, $\boldsymbol{O = 16}$, $\boldsymbol{C = 12}$, $\boldsymbol{H = 1}$)

යූරියා (Urea)
$H_2N - CO - NH_2$

බියුටනොයික් අම්ලය (Butanoic acid)
$CH_3 - CH_2 - CH_2 - COOH$

ටොලුවින් (Toluene) $CH_3$
($C_7H_8$)



ග්ලුකෝස් (Glucose)
$C_6H_{12}O_6$

$Mg_3N_2$

$C_6H_5COOH$

$Na_2B_4O_7$

$HClO_4$

**19.** පහත ප්‍රමාණාත්මක දත්ත උපයෝගි කර ගෙන සංයෝග වල ආනුභාවික සූත්‍ර නිර්ණය කරන්න.

i. $C - 27.3\%$ , $O - 72.7\%$

ii. $Na - 29.1\%$ , $S - 40.5\%$, $O - 30.4\%$

iii. $Na - 32.4\%$, $S - 22.6\%$ , $O - 45.0\%$

iv. $Ca, 3.40\ g$ ක් එහි ක්ලොරයිඩය $9.435\ g$ ක් සාදයි.

v. $Mg, 10.8\ g$ ක් එහි ඔක්සයිඩය $18.0\ g$ ක් සාදයි.

vi. $Fe, 3.528\ g$ ක් එහි ක්ලොරයිඩය $10.237 g$ ක් සාදයි.

**20.** $P$ නැමැති කාබනික සංයොගයේ කාබන් $47.4\%$, හයිඩ්‍රජන් $2.63\%$, නයිට්‍රජන් $18.4\%$, සහ ඔක්සිජන් පමණක් තිබේ. $P$ හි සා.ප.ස් 150 පමණ වේ නම්, අණුක සූත්‍රය සොයන්න.($\boldsymbol{N = 14}$, $\boldsymbol{O = 16}$, $\boldsymbol{C = 12}$, $\boldsymbol{H = 1}$)

**21.** $C, H, O$ පමණක් අඩංගු සංයෝගයක $C - 40\%$ ක් හා $H - 6.67\%$ පවතී. මීට අමතරව $O$ පමණක් අඩංගු වේ. සංයෝගයේ මවුලික ස්කන්ධය $182\ g\ mol^{-1}$ පමණ වේ නම්, සංයෝගයේ අණුභාවික හා අණුක සූත්‍ර සොයන්න. ($\boldsymbol{O = 16}$, $\boldsymbol{C = 12}$, $\boldsymbol{H = 1}$)

**22.** සංයෝගයක 42.6% කාබන් ද, 3.6% හයිඩ්‍රජන් ද, 23.1% ඔක්සිජන් ද, නයිට්‍රජන් ද පමණක් පවතී. සංයෝගයේ මවුලික ස්කන්ධය $200\ g\ mol^{-1}$ පමණ වේ නම්, සංයෝගයේ අණුක සූත්‍රය සොයන්න.

**23.** $A$ නම් සංයෝගයක 35.5% කාබන් ද, 3.4% හයිඩ්‍රජන් ද, 40.7% සල්ෆර් ද, ඔක්සිජන් ද පමණක් පවතී. සංයෝගයේ සා. අ. ස්. 200 පමණ වේ නම්, සංයෝගයේ අණුක සූත්‍රය සොයන්න. ($\boldsymbol{S = 32}$,)

**24.** $C, H, O$ පමණක් ඇති Y කාබනික සංයෝගය පූර්ණ දහනයට ලක් කල විට $CO_2$ සහ $H_2O$, 2:1 යන මවුල අනුපාතයෙන් ලැබේ. Y හි නිරවද්‍ය මවුලික ස්කන්ධය $152\ g\ mol^{-1}$ වේ. Y හි ඇති $O$ ප්‍රතිශතය 40% ට අඩු නම් Y හි අණුක සූත්‍රය සොයන්න. ($\boldsymbol{O = 16}$, $\boldsymbol{C = 12}$, $\boldsymbol{H = 1}$)

**25.** නිෂ්ක්‍රීය පරිසරයක් තුලදී $X$ නම් වූ අකාබනික ලවණය පූර්ණ තාප විඝටනයෙන් $Cr_2O_3 - 1.52\ g$, $N_2 - 0.28\ g$ සහ $H_2O - 0.72\ g$ යන ඵල පමණක් ලබා දෙයි. ($\boldsymbol{H = 1, N = 14, O = 16, Cr = 52}$)

a. $X$ හි ආනුභවික සූත්‍රය අපෝහනය කරන්න.
b. $X$ මවුලයක $Cr$ මවුල දෙකක් අන්තර්ගතය. සංයෝගයේ $H_2O$ අණු අන්තර්ගත වී නොමැත. $X$ හි අඩංගු කැටායනය සහ ඇනයනය සඳහන් කරන්න.
c. $X$ හි රසායනික සූත්‍රය ලියන්න.

**26.** ජලය 54 $g$ ක් හා ඇල්කොහොලය 2.5 $mol$ අඩංගු මිශ්‍රණයක ජලයේ හා ඇල්කොහොල වල මවුල භාග සොයන්න.

**27.** එතනෝල් ($C_2H_5OH$) 22.5 $g$ ක් හා ජලය 77.5 $g$ ක් අඩංගු මිශ්‍රණයක ජලයේ හා එතනෝල් වල මවුල භාග සොයන්න.

**28.** $X(= 27)$ මූලද්‍රව්‍යයේ 15.3 $g$ ක් ඔක්සිජන් හා එකතුව 28.9 $g$ ක ඔක්සයිඩයක් සාදයි. මෙහි ඔක්සයිඩයේ සූත්‍රය සොයන්න.

**29.** රත්‍රන් හා තඹ මිශ්‍ර ලෝහයක වල රත්‍රන් ස්කන්ධ භාගය 0.75 කි එහි රත්‍රන් වල මවුල භාගය සොයන්න. ($\boldsymbol{Cu = 63.5, Au = 197}$)

**29.** $ATP$ යන සංයෝගය සෛල අතර ශක්තිය ප්‍රවාහනය කරයි. $ATP$, 1.6270 $g$ සාම්පලයක 0.3853 $g$ ක් කාබන්, 0.05178 $g$ ක් හයිඩ්‍රජන්, 0.2247 $g$ ක් නයිට්‍රජන් හා ඉතිරිය පොස්පරස් ඇති බව සොයාගන්නා ලදී. ($\boldsymbol{C = 12}$, $\boldsymbol{H = 1}$, $\boldsymbol{N = 14}$, $\boldsymbol{P = 31}$)

a. ATP හි අනුභාවික සූත්‍රය ලබාගන්න.
b. ATP හි මවුලික ස්කන්ධය 507 $gmol^{-1}$ නම් අණුක සූත්‍රය ලබාගන්න.

**30.** A නම් ක්‍රෝමියම් ලවණයේ සංයුතිය මෙසේවේ. $Cr = 14.53\%$, $S = 13.41\%$, $H = 5.03\%$, $O = 67.03\%$. ($\boldsymbol{O = 16}$, $\boldsymbol{Cr = 52}$, $\boldsymbol{H = 1}$, $\boldsymbol{S = 32}$)

a. A හි ක්‍රෝමියම් පරමාණු දෙකක් සමඟ සම්බන්ධ වන ජල අණු සංඛ්‍යාව නිගමනය කරන්න.
b. ඉහත ලවණයේ නිර්ජලීය ආකාරයේ සූත්‍රය කුමක්ද?

**31.** අකාබනික සංයෝගයක $S, H, O$ පමණක් ඇති අතර බර අනුව 1.8% ක් $H$ ද, 56.1% ක් $S$ ද, 42.1% ක් $O$ ද වේ. සංයෝගයේ සා. අ. ස්. 114 ක් වේ.

a. සංයෝගයේ අනුක සූත්‍රය සොයන්න. ($\boldsymbol{S = 32, H = 1, O = 16}$)
b. මෙම සංයෝගයේ ලුවිස් ව්‍යුහ ඇඳ පරමාණුවල ඔක්සිකරන අංක සඳහන් කරන්න.

## සාන්ද්‍රනය ආශ්‍රිත ගණනයන්

**30.** පහත ද්‍රාවණ වල සාන්ද්‍රන සොයන්න.

a. $NaOH$, 4.0 $g$ ක් අඩංගු 500 $cm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ,
b. $Ca(OH)_2$, 7.4 $g$ ක් අඩංගු 5 $dm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ,
c. $H_2SO_4$, 49.0 $g$ ක් අඩංගු 2.5 $dm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ,
d. $HCl$, 73 $g$ ක් අඩංගු 250 $cm^3$ ක පරිමාවක් සහිත ද්‍රාවණයේ,

**31.** පහත ද්‍රාවණ වල ද්‍රාව්‍ය ස්කන්ධය සොයන්න.

a. $0.25\ mol\ dm^{-3}\ NaOH$, 500 $cm^3$ ක පරිමාවක,
b. $0.20\ mol\ dm^{-3}\ HCl$, 250 $cm^3$ ක පරිමාවක,
c. $0.20\ mol\ dm^{-3}\ H_2SO_4$, 2.5 $dm^3$ ක පරිමාවක,
d. $0.25\ mol\ dm^{-3}\ KOH$, 10 $cm^3$ ක පරිමාවක,

**32.** $NaCl, 18.5\ g$ ජලයේ දියකර ගෙන සදාගත් ද්‍රාවණයේ මුලු පරිමාව $885\ cm^3$ නම්, ද්‍රාවණයේ $NaCl$ සාන්ද්‍රනය ගණනය කරන්න.

**33.** $NaOH, 20\ g$ ක් ජලයේ දියකර ගෙන සදාගත් ද්‍රාවණයේ මුලු පරිමාව $250\ cm^3$ නම්, ද්‍රාවණයේ $NaOH$ සාන්ද්‍රනය ගණනය කරන්න.

**34.** සාන්ද්‍රණය $0.14\ mol\ dm^{-3}$ වු $C_6H_{12}O_6$ ද්‍රාවණයකින් $2.8\ dm^3$ ක් පිලියෙල කර ගැනිමට අවශ්‍ය වන $C_6H_{12}O_6$ වල ස්කන්ධය කොපමණද?

**35.** නිර්ජල $Na_2CO_3, 42.4\ g$ ක් ජලයේ දියකර ගෙන සදාගත් ද්‍රාවණයේ මුලු පරිමාව $250\ cm^3$ නම්,

a. ද්‍රාවණයේ $Na^+$, $CO_3^{2-}$ අයන සාන්ද්‍රනය ගණනය කරන්න.

b. ඉහත ද්‍රාවණය සෑදිමට $Na_2CO_3.10\ H_2O$ භාවිත කලේ නම්, අවශ්‍ය ස්කන්ධය ගණනය කරන්න. ($\boldsymbol{Na = 23,\ C = 12, O = 16,\ H = 1}$)

**36.** $Na_2CO_3.10\ H_2O,\ 57.2\ g$ ප්‍රමාණයක් ජලයේ දිය කර මුලු පරිමාව $250\ cm^3$ දක්වා වැඩිකරන ලදි.

a. ජලීය ද්‍රාවණයේ $Na_2CO_3$ සාන්ද්‍රණය ගණනය කරන්න.

b. ඉහත ද්‍රාවණය සෑදිමට නිර්ජලීය $Na_2CO_3$ භාවිත කලේ නම්, අවශ්‍ය ස්කන්ධය ගණනය කරන්න.

**37.** $FeSO_4.(NH_4)_2SO_4.6\ H_2O$ ලවණයෙන් $19.6\ g$ ක් ආස්‍රැත ජලයේ දියකර මුලු පරිමාව $500\ cm^3$ වන ද්‍රාවණයක් සාදාගනි. එම ද්‍රාවණයේ $Fe^{2+}, NH_4^+, SO_4^{2-}$ ඒවායේ සාන්ද්‍රණ සොයන්න.
($\boldsymbol{Fe = 56}$, $\boldsymbol{N = 14}$, $\boldsymbol{O = 16}$, $\boldsymbol{H = 1}$, $\boldsymbol{S = 32}$)

**38.** $1\ mol\ dm^{-3}, NaOH$ ද්‍රාවණ $10\ cm^3$ ක් යොදා ගෙන $0.25\ mol\ dm^{-3}, NaOH$ ද්‍රාවණයකින් කොපමණ පරිමාවක් පිලියෙල කරගත හැකිද? ($\boldsymbol{Na = 23,\ O = 16,\ H = 1}$)

**39.** $1\ mol\ dm^{-3}, NaOH$ ද්‍රාවණයකින් ආරම්භ කරමින් $0.25\ mol\ dm^{-3}, NaOH\ 500\ cm^3$ ක් සෑදිම සඳහා අවශ්‍ය කරන මුල් පරිමාව සොයන්න. ($\boldsymbol{Cl = 35.5}$)

**40.** $12\ mol\ dm^{-3}$ සාන්ද්‍ර $HCl$ ද්‍රාවණයක් විද්‍යාගාරයේ ඇත . මෙම ද්‍රාවණය භාවිතා කර $2\ mol\ dm^{-3}$ සාන්ද්‍රනයෙන් යුත් $250\ cm^3$ ක පරිමා කොටස් 20 ක් සදාගන්නේ කෙසේ ද?

**41.** $Na_2CO_3$ විද්‍යාගාර ප්‍රථමික සම්මතයක් ($primary\ standard\ substance$) ලෙස යොදාගත හැක්කේ ඇයිදැයි පැහැදිලි කරන්න.
$0.02\ mol\ dm^{-3}$ සාන්ද්‍රනයෙන් යුත් ජලීය $Na_2CO_3$ ද්‍රාවණ $250\ cm^3$ ක් සාදාගන්නා ආකාරය ලියන්න.

**42.** $2\ mol\ dm^{-3}, HNO_3$ ද්‍රාවණ $10\ cm^3$ ක් ගෙන අවශ්‍ය පමණට ආස්‍රැත ජලය යොදා $0.25\ mol\ dm^{-3}, HNO_3$ ද්‍රාවණයක් පිලියෙල කරගෙන ඇත. මෙම අවසාන ද්‍රාවණයේ පරිමාව කොපමණ ද?

**43.** $2\ mol\ dm^{-3},\ HCl$ ද්‍රාවණයකින් ආරම්භ කරමින් $0.25\ mol\ dm^{-3}, HCl$ වලින් $250\ cm^3$ ක් සෑදිම සඳහා අවශ්‍ය කරන $HCl$ මුල් පරිමාව සොයන්න.

**44.** $2.5\ mol\ dm^{-3}, HCl$ හා $4\ mol\ dm^{-3}, HCl$ ද්‍රාවණ සපයා ඇත.. මෙම ද්‍රාවණ දෙක පමණක් උපයෝගි කරගෙන $3.25\ mol\ dm^{-3}, HCl$ ද්‍රාවණයකින් $400\ cm^3$ ක් සාදා ගැනිමට මුල් ද්‍රාවණ වලින් එකතු කල යුතු පරිමා සොයන්න.

**45.** $0.5\ mol\ dm^{-3}, HCl$ හා $0.25\ mol\ dm^{-3},\ H_2SO_4$ ද්‍රාවණ ඔබට සපයා ඇත.. මෙම ද්‍රාවණ පමණක් උපයෝගි කරගෙන $H^+$ අයන සාන්ද්‍රණය $0.25\ mol\ dm^{-3}$ වන ද්‍රාවණයකින් $500\ cm^3$ ක් සාදා ගැනීමට මුල් ද්‍රාවණ වලින් එකතු කල යුතු පරිමා සොයන්න.

**46.** $2\ mol\ dm^{-3},\ NaOH$ හා $4\ mol\ dm^{-3}, NaOH$ ද්‍රාවණ සපයා ඇත. මෙම ද්‍රාවණ උපයෝගි කරගෙන $3\ mol\ dm^{-3}, NaOH$ ද්‍රාවණයකින් $500\ cm^3$ ක් සාදා ගැනීමට මුල් ද්‍රාවණ වලින් එකතු කල යුතු පරිමා සොයන්න.

**47.** $0.1\ mol\ dm^{-3}, SrCl_2$ හා $0.1\ mol\ dm^{-3}, AlCl_3$ ද්‍රාවණ සපයා ඇත. මෙම ද්‍රාවණ උපයෝගි කරගෙන $0.1\ mol\ dm^{-3}, Cl^-$ වන ද්‍රාවණයකින් $500\ cm^3$ ක් සාදා ගැනීමට මුල් ද්‍රාවණ වලින් එකතු කල යුතු පරිමා සොයන්න.

**48.** $0.1\ mol\ dm^{-3}, FeSO_4$, $40\ cm^3$ ක් හා $0.4\ mol\ dm^{-3}, Na_2SO_4$ ද්‍රාවණ $60\ cm^3$ ක් මිශ්‍රකර මුලු පරිමාව $100\ cm^3$ වන ද්‍රාවණයක් සාදාගනි. එම ද්‍රාවණයේ $Fe^{2+}, Na^+, SO_4^{2-}$ ඒවායේ සාන්ද්‍රණ සොයන්න.
($\boldsymbol{Fe = 56, O = 16}$, $\boldsymbol{Na = 23}$, $\boldsymbol{S = 32}$)

**ඝනත්වය ආශ්‍රිත ගණනයන්**

**49.** කාමර උෂ්ණත්වයේ දී ජලයේ ඝණත්වය $0.996\ g\ cm^{-3}$ නම්, ජලයේ $H_2O$ සාන්ද්‍රණය සොයන්න.

**50.** කාමර උෂ්ණත්වයේදී $CO_2$ වායුවේ ඝණත්වය $1.78\ g\ cm^{-3}$ වේ. $CO_2$ වායු ඝනමිලිමීටරයක අඩංගු අණු සංඛ්‍යාව සොයන්න. $(\boldsymbol{C = 12, O = 16})$

**51.** විද්‍යාගරයේ ඇති $HCl$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.
ද්‍රාවණයේ ඝණත්වය $-1.18\ g\ cm^{-3}$ ස්කන්ධය අනුව $HCl$ ප්‍රතිශතය $-\ 36.48\%$
ද්‍රාවණයේ $HCl$ සාන්ද්‍රණය සොයන්න. $(\boldsymbol{Cl = 35.5,\ H = 1})$

**52.** විද්‍යාගරයේ ඇති $HNO_3$ බෝතල් ලේබලයක් පහත දක්වා ඇත. ද්‍රාවණයේ $HNO_3$ සාන්ද්‍රණය සොයන්න.
$(\boldsymbol{Cl = 35.5,\ H = 1})$




**53.** විද්‍යාගරයේ ඇති $H_2SO_4$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.

| | |
|---|---|
| sp.gr =1.84 g cm$^{-3}$ | Assay – min 98% |
| M= 98 g mol$^{-1}$ | *SULPHURIC ACID* |

ද්‍රාවණයේ $H_2SO_4$ සාන්ද්‍රණය සොයන්න.
**(S=32, O=16, H=1)**

**54.** විද්‍යාගරයේ ඇති $NH_3$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.
ද්‍රාවණයේ ඝණත්වය $-\ 0.89\ g\ cm^{-3}$ ස්කන්ධය අනුව $NH_3$ ප්‍රතිශතය $-\ 17.03\%$
ද්‍රාවණයේ $NH_3$ සාන්ද්‍රණය සොයන්න. **(N=14, H=1)**

**55.** විද්‍යාගාරයේ ඇති $HNO_3$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත.
ද්‍රාවණයේ ඝණත්වය $-\ 1.45\ g\ cm^{-3}$ ස්කන්ධය අනුව $HNO_3$ ප්‍රතිශතය $-\ 63.03\%$
ද්‍රාවණයේ $HNO_3$ සාන්ද්‍රණය සොයන්න.

**56.** විද්‍යාගාරයේ ඇති $NH_3$ බෝතල් ලේබලයේ පහත තොරතුරු ඇත. ද්‍රාවණයේ $NH_3$ සාන්ද්‍රණය සොයන්න.

2.5 LITS
Ammonia solution
sp.gr =0.89 g cm$^{-3}$
**$NH_3$**
Assay = about 30%
M.W= 17.03

**57.**

| ද්‍රාවණය | | ස්කන්ධය අනුව ප්‍රතිශතය | ද්‍රාවණයේ ඝණත්වය | මවුලික ස්කන්ධය |
|---|---|---|---|---|
| **A** | සාන්ද්‍ර $HCl$ ද්‍රාවණය | 73.001 | 1.08 | 36.5 |
| **B** | සාන්ද්‍ර $H_2SO_4$ ද්‍රාවණය | 97.998 | 1.22 | 98.0 |
| **C** | සාන්ද්‍ර $NaOH$ ද්‍රාවණය | 80.000 | 2.04 | 40.0 |

a. සාන්ද්‍රනය $0.5\ mol\ dm^{-3}$ වු තනුක $HCl$ අම්ල ද්‍රාවණ $500\ cm^3$ ක් පිලියෙල කිරිමට $A$ ද්‍රාවණයෙන් කොපමන පරිමාවක් අවශ්‍යවේ ද?

b. $H^+$ අයන සාන්ද්‍රණය $0.25\ mol\ dm^{-3}$ වන අම්ල ද්‍රාවණ $500\ cm^3$ ක් පිලියෙල කිරිමට $B$ ද්‍රාවණයෙන් කොපමන පරිමාවක් අවශ්‍යවේ ද?

c. $A$ ද්‍රාවණය $50\ cm^3$ ක් හා $B$ ද්‍රාවණය $50\ cm^3$ ක් මිශ්‍ර කර ආස්‍රුත ජලය එකතු කර මුලු පරිමාව $500\ cm^3$ ක් කරන ලදී. ලැබෙන අවසාන ද්‍රාවණයේ $H^+, Cl^-, SO_4^{2-}$ සාන්ද්‍රන සොයන්න.

d. $B$ ද්‍රාවණය $50\ cm^3$ක් හා $C$ ද්‍රාවණය $50\ cm^3$ ක් මිශ්‍ර කර ලැබෙන අවසාන ද්‍රාවණයේ $H^+$ අයන සාන්ද්‍රනය සොයන්න.

**58.** $'880\ ammonia'$ (ද්‍රාවණයෙ ඝණත්වය $0.880\ g\ cm^{-3}$) ලෙස ලේබලයේ සටහන් කර ඇති ඇමෝනියා ද්‍රාවණයේ $1\ dm^3$ ක ඇමෝනියා $245\ g$ ක් අන්තර්ගත වේ. $2\ mol\ dm^{-3}$ ඇමෝනියා ද්‍රාවණ $2\ dm^3$ ක් සාදා ගැනිමට මුල් ද්‍රාවණයෙන් අවශ්‍ය පරිමාව සොයන්න.

**58.** සාන්ද්‍ර හයිඩ්‍රොක්ලෝරික් අම්ලයේ ස්කන්ධය අනුව $HCl$ ප්‍රතිශතය $36\%$ වේ. සාන්ද්‍ර ද්‍රාවණයේ ඝණත්වය $1.18\ g\ cm^{-3}$ නම් සාන්ද්‍රනය $0.1\ mol\ dm^{-3}$ වු තනුක අම්ල ද්‍රාවණ $500\ cm^3$ ක් පිලියෙල කිරිමට සාන්ද්‍ර අම්ලයෙන් කොපමන පරිමාවක් අවශ්‍යවේද ? $(\boldsymbol{Cl = 35.5,\ H = 1})$

**59.** ද්‍රාවණයේ ඝණත්වය $1.5\ g\ cm^{-3}$ හා ස්කන්ධය අනුව ප්‍රතිශතය $-98\%$ වන $H_2SO_4$ ද්‍රාවණයකින් $15\ cm^3$ කට ආස්‍රුත ජලය එකතු කර මුලු පරිමාව $100\ cm^3$ වන ද්‍රාවණයක් සාදාගනි.. එම ද්‍රාවණයෙ $60\ cm^3$ ක් සමඟ ක්‍රියා කිරිමට $0.25\ mol\ dm^{-3}$, $NaOH$ ද්‍රාවණයෙ අවශ්‍ය කරන පරිමාව සොයන්න. $(\boldsymbol{Na = 23, O = 16,\ H = 1, S = 32})$

**60.** සජල $Na_2CO_3 . 10\,H_2O$, $57.2$ g කට ආස්‍රුත ජලය එකතු කර මුලු පරිමාව $150\ cm^3$ වන ද්‍රාවණයක් සාදාගනි. $Na_2CO_3$ හි මවුලිකතාවය සොයන්න. $(\boldsymbol{C = 12,\ Na = 23, O = 16,\ H = 1})$

**61.** නිර්ජල $NaOH$, $60$ g කට ආස්‍රුත ජලය එකතු කර මුලු පරිමාව $100\ cm^3$ වන ද්‍රාවණයක් සාදාගනි. $NaOH$ හි මවුලිකතාවය සොයන්න. $(\boldsymbol{Na = 23, O = 16,\ H = 1})$

**62.** ඝණත්වය $1.10\ g\ cm^{-3}$ වන $C_6H_{12}O_6$ ද්‍රාවණයක මවුලීයතාවය $1.15\ mol\ kg^{-1}$ වේ. $C_6H_{12}O_6$ සාන්ද්‍රණය සොයන්න. $(\boldsymbol{O = 16, C = 12, H = 1})$

**63.** $0.1\ mol\ dm^{-3}, MgCl_2$ ද්‍රාවණයක් සපයා ඇත. මෙම ද්‍රාවණයේ ඝණත්වය $1.25\ g\ cm^{-3}$ නම්, ද්‍රාවණයේ $MgCl_2$ මවුලීයතාවය සොයන්න. $(\boldsymbol{Mg = 24, Cl = 35.5})$

**64.** භූ ජලයේ $5\ g$ ක් තුල $Zn^{2+}, Mn^{2+}$ හා $Fe^{2+}$ ප්‍රමාණය පිළිවෙලින් $0.05\ mg, 0.04\ mg$ හා $0.028\ mg$ ලෙස සඳහන් කර ඇත. භූ ජලයේ,

a. එක් එක් අයන සාන්ද්‍රනය $ppm$ වලින් සොයන්න.

b. එක් එක් අයන සාන්ද්‍රනය $mol\ dm^{-3}$ වලින් සොයන්න.

**65.** මවුල අනුපාතය $1:2$ වන පරිදි $H_2SO_4$ හා $HCl$ මිශ්‍රකර ආම්ලික ද්‍රාවණයක් සාදා ඇත. මෙම ද්‍රාවණයේ $H^+$ සාන්ද්‍රණය $6\ ppm$ නම්, ද්‍රාවණයේ

a. $H^+$ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින් සොයන්න.

b. $Cl^-$ හා $SO_4^{2-}$ සාන්ද්‍රණ $mol\ dm^{-3}$ වලින් සොයන්න.

c. $Cl^-$ හා $SO_4^{2-}$ සාන්ද්‍රණ $ppm$ වලින් සොයන්න. $(\boldsymbol{S = 32, O = 16, Cl = 35.5})$

**66.** $Fe_2(SO_4)_3$ ද්‍රාවණයක් සපයා ඇත. මෙම ද්‍රාවණයේ $Fe^{3+}$ සාන්ද්‍රණය $112\ ppm$ නම්, ද්‍රාවණයේ

a. $Fe^{3+}$ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින්

b. $SO_4^{2-}$ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින්

c. $SO_4^{2-}$ සාන්ද්‍රණය $ppm$ වලින් සොයන්න. $(\boldsymbol{Fe = 56, O = 16,\ S = 32})$

**67.** $Cr_2(SO_4)_3$ ද්‍රාවණයක් සපයා ඇත. මෙම ද්‍රාවණයේ $Cr^{3+}$ සාන්ද්‍රණය $208\ ppm$ නම්, ද්‍රාවණයේ

a. $Cr^{3+}$ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින්

b. $SO_4^{2-}$ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින්

c. $SO_4^{2-}$ සාන්ද්‍රණය $ppm$ වලින් සොයන්න. $(\boldsymbol{Cr = 52, O = 16,\ S = 32})$

**68.** මවුල අනුපාතය $3:2$ වන පරිදි $SrCl_2$ හා $AlCl_3$ මිශ්‍රකර ද්‍රාවණයක් ඇත. මෙම ද්‍රාවණයේ $Cl^-$ සාන්ද්‍රණය $71\ ppm$ නම්, ද්‍රාවණයේ

a. $Cl^-$ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින්

b. $Sr^{2+}$ හා $Al^{3+}$ සාන්ද්‍රණ $mol\ dm^{-3}$ වලින්

c. $Sr^{2+}$ හා $Al^{3+}$ සාන්ද්‍රණ $ppm$ වලින් සොයන්න. $(\boldsymbol{Sr = 88,\ Al = 27,\ Cl = 35}$